# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

# ඇබෑර්තු

# වැඩ සහායක

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පවතින ඉහත ඇබෑර්තුව සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් හා පළපුරුද්ද**

(i) අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම

(ii) NVQ 2 මට්ටම හෝ ඉහළ මට්ටමක සුදුසුකමක් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

(iii) විදුලි තාක්ෂණය හා ජලනල පද්ධති නඩත්තුව ඇතුලු සුළු ගොඩනැගිලි අලුත්වැඩියා සම්බන්ධ දැනුමක් සහිත අයදුම්කරුවන්හට පුමුඛතාවය හිමිවනු ඇත.

**රාජකාරී විස්තරය**

අයදුම්කරු අනුයුක්ත කරන අංශයේ ලිපි ලේඛන ගොනුකිරීම සිදුකළ යුතු අතර, විදුලි පද්ධති දෝෂ නිරාකරණය හා ජලනල පද්ධති නඩත්තු කිරීම ඇතුළුව සුළු ගොඩනැගිලි අලුත්වැඩියා සඳහා සහාය ලබා දීම හා පණිවුඩකරුවකු ලෙස ක්‍රියා කළ යුතුය. රාජකාරී බාරගැනීමේදී විස්තරාත්මක රාජකාරී ලැයිස්තුවක් සපයනු ලැබේ.

**බඳවා ගන්නා ක්‍රමය**

සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව**

2024.12.09 දින වන විට අවු. 18ට නොඅඩු හා අවු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප**

PL 1-2016- රු.24,750/= - 10X250 - 10X270 -7X300 - 15X330 - 37,000/=

**කොන්දේසි**

මෙම තනතුර ස්ථිර කිරීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත්ව සිදු කෙරේ. අභිලාෂී අයදුම්කරුවන්හට ඥාතීන් නොවන දෙදෙනෙකුගේ විස්තර හා සුදුසුකම් සනාථ කෙරෙන සහතිවල ඡායා පිටපත් සමඟ සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2024.12.09** ට හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් යොමුකළ හැක. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"වැඩ සහායක"** ලෙස සඳහන් කළ යුතුය.

**වෛද්‍ය එච්.ඩී.බී. හේරත්**
**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා වෛද්‍ය සභාව,**
**නො. 31, නොරිස් කැනල් පාර, කොළඹ - 10.**
**2024.11.24**